
කඹුරාවලට දීග ගොස් සිටි තාත්තාගේ අක්කා කෙනෙකු වන සේතුහාමි නැන්දාගේ පුතකු වන චූලපාල අයියාට සුදු අක්කාව ජෝඩු කළේ ඇයගේ බේරෙන්නට බැරි තරමේ යෝජනාවකිනි.

''මල්ලියෙ කෙල්ලව අපේ ගෙදරට දියන්. මොකද මගේ පොඩි එකා චූලයගෙත් දැන් කල වයස හරිනෙ. අපි නොහොඳ නෙ-ක්කඩු වෙන් නැතිව ඔන්න ඕක කෙ-රෙන්නම ඕනැ.'' සේතුහාමි නැන්දා තාත්තාට කීවා ය.

සුදු අක්කා සුදු වූවත්, චූලපාල අයියා කළු වූවත්, ඔහු අක්කාට වඩා බොහෝ උස වූවත්, ශරීර පෙනුමෙන් නොගැලපුණත් නැන්දාගේ කීමට පිටු පාන්නට නොහැකිව පැමිණි පොඩි අයියා ගෙන ආ පණ-වුඩයෙන් කියැවුණෝ ඒ ගොල්ලන්ගේ තාත්තා එනම් මනමාලයාගේ තාත්තා වූ අප්පුසිංඤෝ මාමා මිය ගිය පුවත ය. මඟුල් ගෙදරට ඇත්තේ දින තුනකි. මනමාලයාගේ නිවසේ මළ ගෙයකි. මනාලියගේ නිවසේ මඟුල් සිරියාව පි-රෙන්නට පටන් ගෙන ඇත. මරණය නිසා මඟුල් ගෙයවත්, මඟුල් ගෙය නිසා මළගෙදර කටයුතුවත් අතපසු කිරීමට නුපුළුවන. දෙපක්ෂයට ම ඇති වූයේ මහත් ම ගැටලුවකි. මඟුල් ගෙදරට සියල්ල සූදානම් කොට අවසන් ය. අවශ්‍ය කැවිලිපෙවිලි හැළිවළංවල පිරිලා ය. කෙසෙල් කැන් පිළිකන්නේ වළක සැඟවී දුම් සාත්තුව ලබමින් පසුවේ. ගමට ම මඟුල් කියා අවසන් ය. මඟුල් මඩුවේ පෙන්නීම බාරව තිබූ නිසා ය. මම ද පාසලට අඳින කොට කලිසම සහ කමිසය ඇඳගෙන අතුරේ දෙමළ ඉස්කෝලය අසලට ගොස් මඟුල් නඩය එනතුරු බලා සිටියේ දෙපයට සෙරෙප්පුවත් නොමැතිව ය.

කසාදය ලියාපදිංචි කිරීමෙන් පසුව සුදු අක්කා ද චූලපාල අයියා පැමිණි කෑ ඉංග්‍රීසි අකුරු මුලට ඇති අංකය සහිත කාර් රථයට නැග පැමිණියේ අපේ ගෙදරට ම ය. ආපසු එනවිට මට




# සුදුඅක්කා සහ ඇවැස්ස දීගය 2

මංගල්ලේ තීන්දු වූයේ නැන්දාගේ තවත් ගමන් වාර කීපයකින් පසුව ය. චූලපාල අයියා ද අපේ ගෙදරට යන එන ගමන් වාර ප්‍රමාණය ක්‍රමයෙන් වැඩි විය.

එක් දහස් නවසිය හැට තුනේ දී අක්කාගේ මංගල්ලය සිදු වූයේ අම්මා ද තවත් විශාල බඩ ගෙඩියකට හිමි කාරියක් වී සිටි අවදියේ දී ම ය. මගුල් කීම සඳහා සුදු ලේන්සුවක ඔතාගත් බුලත් අතත් රැගෙන බොහෝ ගෙවල්වලට අම්මා ගියේ කුස තුළ සිටින නිමල් මල්ලීව ද ඔසවාගෙන පයින් ම ය.
රබර් ගසක් කැපී පැළී පිටුපස දරමඩුවේ අඩුක් විණ. පුවක් ගස් කීපයක් කැපී මිදුල මැද මඟුල් මඩුව ගොඩ නැගිණි. වහලට අමු පොල්අතු වියා හෙවිල්ලූ අතර මඟුල් මඩුව වටේ ඇහිරීම සඳහා යොදා ගත්තේ ගොක් කොළ සහ තද කොළ පැහැති පොල් කොළ එක්කොට දාන් කොටු ආක-ාරයට වියූ සැරසිල්ලකිනි. ඉහළ කොටස පුවක් පටි ගසා සකස් කර පුවක් පටි වැ-සෙන්නට මල් ලියකම් කපා සැරසුවේ මාරහේනේ වේලු ය. කොළපාට සහ රතුපාට කුකුළු සායම්වලින් සුදුපාට කඩදාසිවල පලාපෙති මෝස්තර සිත්තම කෙරුණේ වේලු අතිනි.

මඟුල් මඩුවට මෙහායින් පාර පැත්තට වන්නට තිබුණේ වාරයට ඉතා හොඳින් පල දරන කජු ගසකි. මෙම කජු ගස නිසා පාරට මඟුල් මඩුව පෙනුණේ ගසේ අතු අතරින් මඳ වශයෙනි. අප දිනක් පාසල් ගොස් එන විට මිදුලේ තිබුණු කජු ගස කැපී බිම වැටී තිබුණු අතර සුදු අක්කා එහි අතු පාහිමින් සිටියා ය.
ගුණපාල මල්ලීත් මාත් මිදුලට ගියේ දෑසේ කඳුළු පුරවාගෙන ය. හැදී ගෙන එන කිරි කජු බොහෝය. ඒවා කොළ පැහැති පුහුලන් ගැට සමග බිම විසිරී තිබුණි. අක්කා ඉතා කඩිසරව අතු පාහියි.


''අක්කෙ මොකෝ කජු ගහ කැපුවෙ''
''කජ්ජු ගා කප්පු එක තමා ඔන්ද. දෙන් පාරට ඔන්දට ජේනවා''
වේලු අක්කාගේ මතයට පෝර දමයි.

''දැන් බලාපන්කො පාරට ගිහිල්ල කොහෙ-ාමද කියල මඟුල් මඩුව ජේන ලස්සන. ''
අක්කාට මගුල් මඩුවේ ලස්සන මිසක කජු ගසේ වටිනාකම නොදැනුණේ කාගේ පවට දැ යි සිතා ගැනීමටවත් බැරි ය.

''අපරාදෙ නේද සුදක්කෙ''
''පණ්ඩිතකම තියල බත් කාල ඇවිත් මේ අතු පාහින්න ටිකක් උදව් වෙයන්.'' එහෙත් මා කජුඅතු පාහින්නට උදව් වූයේ නැත.

එක්දහස් නවසිය හැට තුනේ අවසන් භාගයේ එක් දිනක උදයේ ම කඹුරාවලින් සැරසිලි අවසන් භාගයේ ය. මඟුල් කෙසේවත් කල් දැමීමට නොහැකි ය. දස අත ණය වී, අතමාරු ඉල්ලාගෙන ඉතා අරපිරිමැස්මෙන් සියල්ල සූදානම් කොට තිබූ නිසා මේ සියල්ල නවතා මළ ගෙදරට පමණක් මුල් තැන දී කටයුතු කළහොත් ඊ ළඟට මඟුල් ගෙයක් ගැන සිතීමටවත් නුපුළුවන. මඟුල් ගෙය නොගත්තොත් මඟුල් අවසානයේ ගෙවීමට පොරොන්දු වී ගත් ණය ගෙවන්නේ කෙසේ ද?

තාත්තාගේ පවුලේ වැඩිහිටියා වූ වෙල්ගම නෝරිස් මහප්පා සහ



කඹුරාවල සේතුහාමි නැන්දාත් මුල් වී වැඩිහිටියන් සමග කළ සාකච්ඡාවෙන් පසු තීරණය වූයේ කලින් ගත් තීරණය පරිදි නියමිත දිනට මඟුල් ගේ ගත යුතු බවට ය. ඒ අනුව මංගල්ලේ සිදු කිරීමට ද කටයුතු යෙදිණ.

අප්පුසිංඤෝ මාමාගේ මළගමින් පසු දින කඹුරාවලින් එක කාර් රථයකින් මනමාලයා ඇතුළු කීප දෙනෙක් බඹරැල්ලකුල පාලම අසල රෙජිස්ත්‍රාර් රාළහාමිගේ නිවසට පැමිණි අතර අපේ නිවසින් ද එක කාරයකින් මනමාලිය වූ සුදුඅක්කා ඇතුළු පිරිස එතැනට ළඟා වූහ. එම ගමනට මට ද යා හැකි වූයේ කඹුරාවලින් එන පිරිසට රෙජිස්ත්‍රාර්වරයාගේ කාර්යාලයට යන පාර ඒමට සිදු වූයේ පාරේ බස් රථයෙනි. මා නිවසට එන විට ජයමංගල ගාථා ද කියා අවසන් ය.

මා ගෙදරට එන විට තාත්තා අමරසේන මහතාගේ කඩයේ තිබී හිස උඩ තබාගෙන පැමිණි ග්‍රෑමෆෝන් එක ක්‍රියාත්මක කොට සින්දු දමමින් සිටියේ කරන්නාගොඩ ගුණතිලක බාප්පා ය. ග්‍රෑමපෝනය අසල අපට තහනම් කලාපයක් විය. කාර්රථ දෙකෙන් පැමිණි පිරිසට අමතර ඥාති පිරිස පැමිණ තිබුණේ පාරේ බස්රථවලිනි.

බත් මාළු සමග මඟුල් මේසය ලැහැස්ති කර තිබුණේ දෙපාර්ශ්වයේ නෑදෑයින්ට සහ එදින දහවල් පැමිණි පිරිසට පමණ ය. පසුව මඟුල් ගෙදරට පැමිණෙන ආරාධිත පිරිසට බත් මාළුපිනිවලින් සංග්‍රහයක් නොවිණි. ඒ වෙනුවට තිබුණේ කැවිලිපෙවිලිවලින් සැරසුණු මේසයක් පමණි. කැවුම්, කොකිස්, අතිරස, අග්ගලා, අලුවා, ආස්මී, ගොඩපර, වැනි කැවිලි වර්ග සහ ආනමාළු, ඇම්බුන්, කෝලිකුට්ටු, සුවඳැල් ආදී කෙසෙල්වලින් මේසය අලංකාර ලෙස පිළියෙල කෙරිණි. මඟුල් කෑම සඳහා එන පිරිසට ආයුබෝ-වන් කීමෙන් පසු පළමුවෙන් ම බුලත් හෙප්පුව පිළිගන්වයි. ඊ ළඟට සිගරට් බොන පිරිසට ත්‍රීරෝ-ෝසස්, කැප්ස්ටන්, නැවිකට්, බ්‍රිස්ටල් ආදී සිගරට් වර්ග කීපයකින් යුතු පැකට් සහිත බඳුන අල්ලාගෙන යනු ලබයි. ඉන්පසු ටික වේලාවකින් ''ඇට්හෝම් මේසය'' සඳහා ආරාධනා කරනු ලබන්නේ වතුර වීදුරු කීපයකින් යුතු බඳුනකින් වතුර පිළිගැන්වීමෙනි. මඟුල් කෑමට පැමිණි තැනැත්තා වතුර වීදුරුවක් අතට ගෙන එළියට බැස බුලත් හපය කටින් පිටතට දමා කට සෝදා ගෙන කැවිලි මේසයට ගොස් තමා රිසි පරිදි කෑම වර්ග කීපයක් කයි. පසුව ලැබෙන ඔරේන්ජ් බාර්ලි වීදුරුවකින් සප්පායම් වෙයි. අනතුරුව කනප්පුවක් මත තබා ඇති ලියුම් කවර මිටියෙන් ලියුම් කවරයක් ගෙන, එතැන ම ඇති පැන්සලයෙන් තම ලිපිනය ලියා කිසිවකුට නොපෙනෙන්නට එයට මුදල් දමා තාත්තා අතට දී ආයුබෝවන් කියා පිටත්ව යයි. කවරයට දමන මුදල් ප්‍රමාණය වනුයේ රුපියලේ කොළයක්, දෙකේ කොළයක්, පහේ කොළයක් වැනි මුදලකි. මඟුල් කවර කඩන විට රුපියල් දහයක කොළයක් දක-ින්නට ලැබෙන්නේ ඉතාමත් කලාතුරකින් කවරයක විශේෂිත පුද්ගලයකුගෙනි. වැඩිය තිබෙන්නේ රුපියලේ කොළ ය.

සති දෙකකට පමණ පසු චූලපාල අයියා සුදු අක්කාව කඹුරාවලට කැන්දාගෙන ගියේ පාරේ බස්වලිනි. ඒ ගමනට අම්මා, තාත්තා සමග මම ද කඹුරාවල ගියෙමි. කැවිලි පෙවිලි පෙට්ටි කීපයක් ද සහිතව ගේ ළඟින් බස්රියට නැග, ගියේ අතුරෙන් කලවැල්ලාව හරහා ය. එවකට බස් රථ තිබුණේ හොරණ සිට කලවැල්ලාවට පමණි. හොරණ සිට කලවැල්ලාවට එන බස් රථයට අතුරින් ගොඩ වී කලවැල්ලාව තොටුපළින් බැස්සේ එතැනින් පසු පාලම්පාරුවෙන් හෝ ඔරුවෙන් එගොඩ විය යුතු බැවිනි. කලවැල්ලාවේ මෙගොඩ ගොඩේ තේ කඩ කිහිපයක් තිබුණි. බසය හැරවීම සඳහා පාවිච්චි කළ මිරිස්හේන පාර දෙපස කඩ පේළි දෙකක් විය. ඒවා සාදා තිබුණේ ලෑලිවලින් වූවත් කිසියම් ක්‍රමානුකූල අයුරකිනි.

ගොන් බැඳි කරත්තයක් සහ වෑන් රථයක් පැටවූ පාලම්පාරුව එගොඩට යාමට සූදානම් ය. අපි වහා දුවගොස් පාලම්පාරුවට ගොඩ වූයෙමු. එක් අයකුට සත පහක් ගණනේ වූ තොටුපළේ ගාස්තුව ගෙවා දැමුවේ චූලපාල අයියා ය. එගොඩ ගොඩෙන් ගොඩ වූ අප කලවැල්ලාවේ සිට මතුගමට යන බස්රථයකට ගොඩ වී අගලවත්තෙන් බැස, මතුගම සිට බදුරලිය බලා යන බස්රථයකට ගොඩ වී ගොස් කඹුරාවල, කළුගල හන්දියෙන් බැස වේලි දිගේ අඩිපාරෙන් චූලපාල අයියලාගේ ගෙදරට ගියේ දෙකකුල්වල එල්ලෙන කූඩැල්ලන් ද කඩා විසි කරමිනි.

අවසානයි